සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2944

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.................................................... විභාග අංකය:-................................................

I කොටස

අයදුම්කරුවන්ට උපදෙස්
- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති රූප සටහන් හඳුනාගෙන ඊට යටින් ඇති තිත් ඉර මත ලියන්න.

01.

..................................................

02.

..................................................

03.

..................................................

04.

..................................................

05.

..................................................

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

06. "සකපෝරුව" නැමැති උපකරණය භාවිත වන්නේ,
   1. ලාක්ෂා කර්මාන්තයේදී
   2. වෙස්මුහුණු කර්මාන්තයේදී
   3. මැටි කර්මාන්තයේදී
   4. පිත්තල කර්මාන්තයේදී

07. විතර්ක මුද්‍රාවෙන් සංකේතවත් වන්නේ,
   1. ධර්මය දේශනා කරන අවස්ථාව
   2. වරයක් දීම
   3. ගැටලුවක් විසඳන අවස්ථාව
   4. ධ්‍යානයට සමවැදී සිටීම

08. යුරෝපා ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර ඇති ස්ථානයක් <u>නොවන්නේ,</u>
   1. ෆොන්ඩිගෝම් ගුහාව
   2. ඇල්ටමීරා ගුහාව
   3. කෝගුල් ගුහාව
   4. දොරවක ගුහාව

09. මූලික වර්ණ වන්නේ,
   1. නිල්, කොළ, දම්
   2. නිල්, රතු, දම්
   3. නිල්, කහ, රතු
   4. නිල්, කහ, දම්

10. දමිළ ජනයා අතර ප්‍රචලිත ශාන්තිකර්මයක් වන්නේ,

1. පහන්මඩු ශාන්තිකර්මය
2. දෙවොල්මඩු ශාන්තිකර්මය
3. කුම්බාබිෂේකම් ශාන්තිකර්මය
4. කොහොඹා කංකාරිය

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට ඇතුළත් වගන්ති නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණත් වරහන් තුළ ලියන්න.

11. බුද්ධාගම ප්‍රතිශ්ඨාපනය වීමෙන් පසු ඉදිවූ පළමු ස්තූපය ථූපාරාමය වේ. ( )
12. සමීප වස්තූන් විශාලවත් දුර තිබෙන වස්තූන් කුඩාවටත් දැක්වීම "පර්යාලෝකය" ලෙස හැඳින්වේ. ( )
13. ඉවතලන කඩදාසි රෙදි කැබලි වැනි දෑ ඉරා හෝ කපා ඇලවීම ටෙම්ප්ලේට් ලෙස හැඳින්වේ. ( )
14. හින්දු භක්තිකයෝ "නන්දි ගවයා" ශිව දෙවියන්ගේ වාහනය ලෙස සලකති. ( )
15. අල්ප උන්නත කැටයමක් කිරීම සඳහා පහසුම මාධ්‍යයක් ලෙස සැජුෆෝම් යොදා ගත හැකිය. ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර ලියන්න.

16. කැලණිය, නවගමුව, මොළගොඩ, පුදුක්කුඩිරුප්පු, එරාවුල් යන ප්‍රදේශ ප්‍රචලිතව පවත්නා සාම්ප්‍රදායික ජනකලා කර්මාන්තය කුමක් ද? ..........................................................

17. වර්ණ චක්‍රගත කිරීමේදී දම්, කොළ, තැඹිලි යන වර්ණ තුන හඳුන්වන පොදු නාමය වන්නේ කුමක් ද? ..........................................................

18. සිංහල සැරසිලි මෝස්තර වර්ගීකරණයේදී "ඉරහඳ" අයත් වන කාණ්ඩය වන්නේ කුමක් ද? ..........................................................

19. කුම්බාබිෂේකම් ශාන්ති කර්මය හා සබැඳි චාරිත්‍ර ඉටුකිරීම සඳහා හින්දු කෝවිල ආශ්‍රිතව ඉදිකෙරෙන "මඩුව" හඳුන්වන්නේ කුමන නමකින් ද? ..........................................................

20. රතු පැහැති ටොෆි කොළ දවටනයකින් නිල් අහස දෙස බැලීමේදී දිස්වන වර්ණය කුමක් ද? ..........................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති වචනයන් චිත්‍ර කලාවට අදාළව අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය ලියන්න.

21. නෙළීම ..........................................................
22. ඇඹීම ..........................................................
23 අංජලී ..........................................................
24. පරදුඃඛ දුඃඛිත ..........................................................
25. වීරාසන ..........................................................

- පහත දැක්වෙන රූප සටහන් හඳුනාගෙන ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



26. හමුවන ස්ථානය ..........................................................
27. අයත් රට ..........................................................
28. යුගය ..........................................................

29. හමුවන ස්ථානය ..........................................................................

30. අයත් රට ....................................................



(ලකුණු 01x30 = 30යි)

## II කොටස

- පහත දැක්වෙන "අ" කොටස අනිවාර්යයි.
- "ආ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

### II "අ" කොටස

- ඔබට ලබා දී ඇති රේඛා සටහන ඔබේ කඩදාසියට ගැලපෙන සේ විශාලකර අඳින්න
- <u>පැන්සල භාවිතයෙන්</u> ත්‍රිමාන ලක්ෂණ හා ද්‍රව්‍යයන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ ගන්වන්න.



(ලකුණු 10යි)

### II "ආ" කොටස

- පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

1. "ගමේ පොළ" එහි සිත්ගත් අවස්ථාවක් ඇඳ වර්ණ කරන්න.
2. "දුක්බර මොහොතක්" සිතෙන පරිදි ඇඳ වර්ණ කරන්න.
3. "නිදහසේ සැරිසරන වනසතුන්" ඇඳ වර්ණ කරන්න.
4. සමචතුරශ්‍රාකාර කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.
5. "සරොම් වාටියක්" සඳහා සුදුසු සැරසිල්ලක් සත්ව හෝ ශාක පත්‍ර ඇසුරින් ඇඳ වර්ණ කරන්න.
6. ළමා කතන්දර පොතක පිටකවරයට සුදුසු චිත්‍රයක් ඇඳ වර්ණකරන්න. (ඔබ කැමති නමක් කතන්දර පොතට යොදන්න.)
7. "සිතුවම් දැක්ම" යන වදන් අභිමත අකුරු ක්‍රමයකට (ශෛලියකට) ඇඳ විචිත්‍රව වර්ණ කරන්න.

(ලකුණු 60යි)